සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
*All Rights Reserved*

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත්
மேல் மாகாணக் கல்வித் திணைக்களம் மேல் மாகாணக் கல்வித் தி
Department Of Education – Western Province Dep

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department Of Education – Western Province**

**දෙවන වාර ඇගයීම**
**இரண்டாம் தவணை மதிப்பீடு - 2018**
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I , II | කාලය / காலம் / Time: පැය 02 යි. |

නම :-…………………… ………………………………………… විභාග අංකය :- …………………

## I කොටස

- **1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.**


**01.** සංඛ්‍යා රටාවක සාධාරණ පදය $T_n = 5n - 8$ වේ. එම රටාවේ 7 වන පදය සොයන්න.

**02.** සුළු කරන්න. $1101_{දෙක} + 1010_{දෙක}$

**03.** රු. 600 ක් වටිනා කමිසයක් විකිණීමේදී රු. 30 ක වට්ටමක් ලබාදෙයි නම් ලැබෙන වට්ටම් ප්‍රතිශතය කොපමණද?

**04.** සුළු කරන්න. $1\frac{1}{5}$ න් $\frac{2}{3}$

**05.** $x$ හි අගය සොයන්න.




**06.** හිස්තැන් සඳහා සුදුසු අගයන් ලියන්න. $(x - 3)(x + 5) = x^2 + \square\, x - \square$

**07.** ඒකාකාර වේගයෙන් ගමන් ගන්නා මෝටර් රථයක් පැය 3 දී 210 km ක් ගමන් කරයි නම් පැය 5 දී ගමන් කරන දුර කොපමණද?


**08.** සුළු කරන්න. $(3x^5)^2$

www.mathsland.org

**09.** $\frac{3}{4}$ ප්‍රතිශතයක් ලෙස දැක්වීමට සිසුවෙක් විද්‍යාත්මක ගණක යන්ත්‍රයක යතුරු ක්‍රියාත්මක කළ ආකාරය පහත දැක් වේ. එහි හිස්තැන් පුරවන්න.

ON → 3 → ÷ → 4 → ☐ → = (%) → ☐ 75

**10.** රූපයේ AB හා CD රේඛා සමාන්තර වේ. $K\hat{L}M = 60°$ ද $L\hat{K}M = 50°$ ද නම් $D\hat{K}M$ හි අගය සොයන්න.




**11.** විද්‍යාත්මක අංකනයෙන් පහත දී ඇති සංඛ්‍යා සාමාන්‍ය ආකාරයෙන් ලියන්න.

**(i)** $7.871 \times 10^{2}$ = ................................ **(ii)** $7.871 \times 10^{-2}$ = ...............................

**12.** $y = mx + c$ සූත්‍රයේ $x$ උක්ත කරන්න.

www.mathsland.org


**13.** අරය 35 cm ක් වූ රෝදයක් සමතල පාරක් දිගේ එක් වටයක් තල්ලු කළ විට ගමන් කරන දුර කොපමණද?

**14.** යම් සංඛ්‍යාවක් ආසන්න 10 ට වටැයීම කළ විට පිළිතුර 60 කි. වටැයීමට පෙර සංඛ්‍යාව විය හැකි අඩුම අගය හා වැඩිම අගය කීයද?

**15.** දිග 30 cm ද පළල 20 cm ද උස 15 cm ද වන ඝනකාභ හැඩති බඳුනකට දැමිය හැකි උපරිම ජල ප්‍රමාණය මිලි ලීටර කොපමණද?

**16.** $p = 4$ ද $q = -\frac{1}{3}$ ද නම්, $5p - 9q$ හි අගය සොයන්න.

**17.** රූප සටහනේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




**18.** වෘත්තයක අරය 6.74 cm නම් එම අගය,

**(i)** පළමු දශමස්ථානයට වටයන්න.

**(ii)** ආසන්න සෙන්ටිමීටරයට වටයන්න.

**19.** $a + b = 180°$ ද $b + c = 180°$ ද බව දී ඇති විට ප්‍රත්‍යක්ෂ ඇසුරෙන් එළඹිය හැකි අවසාන නිගමනය කුමක්ද?

**20.** සාධක භාවිතයෙන් අගය සොයන්න. $99^{2} - 1$

## II කොටස

- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක්ද අනෙක් ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

**01.** ඔබ විසින් පන්ති කාමරයේදී අධ්‍යනය කරන ලද **පථ හා නිර්මාණ** පාඩම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(a)** **(i)** පථ හැඳින්වීම සඳහා සුදුසු නිර්වචනයක් ලියා දක්වන්න.

**(ii)** එම පාඩමේදී ඔබ විසින් අධ්‍යනය කළ මූලික පථ ගණන කීයද?

**(iii)** එහිදී ඔබ විසින් අධ්‍යනය කළ මූලික පථ අතරින් එක් පථයක් කෙටියෙන් විස්තර කරන්න.

**(iv)** ඔබ විසින් ඉහත විස්තර කරන ලද පථය හඳුනාගැනීම සඳහා පන්ති කාමරයේදී කරන ලද ක්‍රියාකාරකමක් කෙටියෙන් පැහැදිලි කරන්න.

**(b)** **(i)** සුළු කෝණී ත්‍රිකෝණයක් ඇඳ එය ABC ලෙස නම් කරන්න.

**(ii)** AB රේඛාවේ ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

**(iii)** A ලක්ෂයේ සිට BC රේඛාවට ලම්බකයක් නිර්මාණය කරන්න.

**(c)** **(i)** 6cm ක් දිග රේඛා ඛණ්ඩයක් නිර්මාණය කර එය PQ ලෙස නම් කරන්න.

**(ii)** PQ බාහුවක් වන සේ Q හිදී $60^\circ$ ක කෝණයක් නිර්මාණය කර එම කෝණය PQR ලෙස නම් කරන්න.

www.mathsland.org

**(iii)** $P\hat{Q}R$ හි කෝණ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

**02.** **(a)** **(i)** පහත දී ඇති එක් එක් සමානුපාතයේ හිස්තැනට ගැලපෙන අගය ලියා දක්වන්න.

3 : 5 = ______ : 30

10 : ___ = 80 : 24

**(ii)** සිසිල් බීම නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක යන්ත්‍රයකින් මිනිත්තු 8 දී බීම බෝතල් 160 ක් පුරවනු ලබයි නම් මිනිත්තු 5 දී පිරවිය හැකි බීම බෝතල් ගණන සමානුපාත භාවිතයෙන් ගණනය කරන්න.

**(b)** වෙළෙන්දෙක් ඇමරිකන් ඩොලරයක විනිමය අනුපාතිකය රු. 160 ක් වූ දිනක වටිනාකම ඇමරිකන් ඩොලර් 90 බැගින් වූ විදුලි උපකරණ තොගයක් ආනයනය කරයි.

**(i)** විදුලි උපකරණයක ආනයනික වටිනාකම ශ්‍රී ලංකා රුපියල් කීයද?

**(ii)** වෙළෙන්දා 20% ක ලාභයක් ලැබෙන සේ විදුලි උපකරණයක් විකිණීමට ලකුණු කල යුතු මිල කීයද?

**(iii)** විදුලි උපකරණය විකිණීමේ දී 5% ක වට්ටමක් දෙනු ලබයි නම් ලැබෙන වට්ටම් මුදල කොපමණද?

**03.** **(a)** පහත දැක්වෙන සරල සමීරණ විසඳන්න.

**(i)** $\frac{2x}{3} + \frac{x}{2} = 21$     **(ii)** $3\{2(x+1) - 1\} = 9$

**(b)** සමගාමී සමීකරණ යුගල විසඳීමෙන් $a$ හා b අගයන් සොයන්න.

$2a + b = 13$

$3a - b = 12$

**04.** **(a)** $y = -2x + 3$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට සකස් කරන ලද අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| $x$ | $-1$ | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|
| $y$ | ......... | 3 | 1 | $-1$ | $-3$ | ......... |

**(i)** පිළිතුර ලබාගත් ආකාරය දක්වමින් වගුවේ හිස්තැන් පුරවන්න.

**(ii)** ඛණ්ඩාංක තලයක් මත ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳ දක්වන්න.


**(iii)** මෙම ශ්‍රිතයේ ප්‍රස්තාරයට සමාන්තරව මූල ලක්ෂය හරහා ගමන් කරන ප්‍රස්තාරයේ සමීකරණය ලියන්න.

**(b)** **(i)** $3x + 2y = 6$ ශ්‍රිතයේ ප්‍රස්තාරය නොඇඳ එම ප්‍රස්තාරයේ අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය ලියා දක්වන්න.

**(ii)** $3x + 2y = 6$ ප්‍රස්තාරය ඇඳීමෙන් තොරව එම ප්‍රස්තාරය මඟින් $x$ අක්ෂය හා $y$ අක්ෂය ඡේදනය කරන ලක්ෂ්‍යවල ඛණ්ඩාංක ලියා දක්වන්න.

www.mathsland.org

**05.** උද්‍යානයක සකස් කර ඇති ත්‍රිකෝණාකාර කොටසකින් හා අර්ධ වෘත්තාකාර කොටසකින් සමන්විත මල් පාත්තියක මිනුම් සහිත රූප සටහනක් මෙහි දැක් වේ.




**(i)** වෘත්තාකාර කොටසේ අරය කීයද?


**(ii)** BCD චාප කොටසේ දිග ගණනය කරන්න.

**(iii)** AD මායිමේ දිග සොයන්න.

**(iv)** මල් පාත්තියේ පරිමිතිය සොයන්න.

**(v)** මල් පාත්තිය වටා ආරක්ෂිත වැටක් ලෙස 50 cm ක පරතරය සිටින සේ සිටුවීමට අවශ්‍යය ලී කණු ගණන කොපමණද?

**06.** **(a)** ABC ත්‍රිකෝණයේ AC පාදය D තෙක් දික්කර ඇති අතර AB පාදයට සමාන්තරව CE ඇඳ ඇත.





**(i)** $A\hat{B}C$ ට සමාන කෝණයක් නම් කර සමාන වීමට හේතුව ලියා දක්වන්න.

**(ii)** $B\hat{A}C$ ට සමාන කෝණයක් නම් කර සමාන වීමට හේතුව ලියා දක්වන්න.

**(iii)** ප්‍රත්‍යක්ෂ ඇසුරින් $A\hat{B}C + B\hat{A}C = B\hat{C}D$ බව පෙන්වන්න.

**(iv)** (iii) හි දී ලබාගත් සම්බන්ධය ආශ්‍රිත ප්‍රමේයය ලියා දක්වන්න.

**(b)** රූපයේ දී ඇති දත්ත ඇසුරින් $x$ , y හා z මඟින් දක්වා ඇති කෝණවල විශාලත්ව සොයන්න.




**07.** **(a)** දර්ශක නීති යොදා ගනිමින් සුළු කරන්න.

**(i)** $\dfrac{4x^3 \times 3x^2}{6x^5}$ **(ii)** $\dfrac{(a^3)^{-2} \times a^4}{(a^{-2})^2}$

**(b)** අගය සොයන්න.

**(i)** $3^{-2} + \dfrac{1}{3}$ **(ii)** $3.5 \times 10^2 \times 2 \times 10^2$